# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සහ අර්ධකාලීන රැකියා.

එස්.ඒ.ඩී.එම්.ඩී.ඒ. විජේසිංහ[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ විද්‍යාර්ථීන් අර්ධකාලීන රැකියා සඳහා යොමුවීම විශ්වවිද්‍යාල අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා ගැටලුවක් වේද යන්න මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කර ඇත. කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ නියෝජනය වන පරිදි 2015 වර්ෂයේ අධ්‍යාපනය ලබන සිසුන් 100ක් සරල සසම්භාවී නියැදියක් මෙම අධ්‍යනය සඳහා යොදා ගන්නා ලදී. මෙමගින් ලබාගත් දත්ත කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් සහ ප්‍රතිශතාත්මක මිනුම් ඇසුරින් විශ්ලේෂණය කරන ලදී. අර්ධකාලීන රැකියා නිසා විද්‍යාර්ථීන්ගේ ආර්ථිකය යහපත් වුවද අධ්‍යාපනයට බාධා පමුණුවයි යන්න උපන්‍යාසය වූ අතර අර්ධකාලීන රැකියාවේ ස්වාභාවය, අධ්‍යාපනය සඳහා බලපාන ආකාරය, අනාගත රැකියා සඳහා ලැබෙන ප්‍රයෝජන, අර්ධකාලීන රැකියාවෙන් උපයන ආදායම ප්‍රමාණවත් ද සහ ශ්‍රී ලංකාව තුළ ඇති ආකල්පය යන ප්‍රධාන සාධක ඔස්සේ දත්ත විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනයට අනුව 56% ක පමණ ප්‍රමාණයක් තම රැකියාව අධ්‍යාපනයට බලපාන බවත් 68% ක ප්‍රමාණයක් තමන් නිරත වන රැකියාව අනාගතයට ප්‍රයෝජනවත් නොවන බවත් පවසයි. අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාව තුළ ශිෂ්‍යයින්ට පාසල් අධ්‍යාපනය අවසන් වනතුරු ආර්ථික ගැටලු ඇති නොවන නමුත් උසස් අධ්‍යාපන කාලය තුළ ආර්ථික ගැටලු රැසක් ඇති බව හෙළි විය. ප්‍රායෝගික අධ්‍යයනය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කිසිදු ආයතනයකින් අවධානය යොමු නොකරන බවත් රාජ්‍ය විශ්වවිද්‍යාල හෝ ආයතන විසින් ශිෂ්‍යයාට දැනුම ලබා දුන්න ද ප්‍රායෝගික පුහුණුව ලබාගත හැකි විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත් සනාථ විය. මේ නිසා ශ්‍රී ලංකාවේ විද්‍යාර්ථීන් අක්‍රමවත් හෝ වගකීමකින් තොර අර්ධකාලීන රැකියා සඳහා ද යොමු වන බව හේතු විය. තම ආර්ථික ගැටලු විසඳා ගැනීමට ශිෂ්‍යයින් වැඩි ප්‍රතිශතයක් අවිධිමත් රැකියා සඳහා යොමුවන අතර ඒ තුළ ශිෂ්‍යයින්ගේ ශ්‍රමය සූරාකෑම, අනාරක්ෂිත බව සේම එය තමන් අධ්‍යාපනය ලබන ක්ෂේත්‍රයට ද රැකුලක් නොවන බව තහවුරු විය. අර්ධකාලීන රැකියා ශිෂ්‍යයින්ට සාධාරණයක් සිදු නොකරන හා අනාගතයට රැකුලක් නොවන නමුත් ශිෂ්‍යයින් එයට යොමුවීම නොවැළැක්විය හැකි බව තහවුරු විය. මේ නිසා ශිෂ්‍යයින්ගේ අධ්‍යයන ක්ෂේත්‍රයට උචිත අර්ධකාලීන රැකියා ලබාදීම තුළින් ශිෂ්‍යයාට මෙන්ම ආර්ථිකයට ද ඵලදායි වන බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථීන්, අර්ධකාලීන රැකියා, ආර්ථිකය, ශිෂ්‍යයින්*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
dilumiasinsana@yahoo.com